## 2022/10/11 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2022/10/11 දින පෙ.ව. 09.30 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගී වූ**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. | එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 19. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 21. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 22. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |
| 27. | ප්‍රියංගිකා දිල්රුක්ෂි ඒකනායක | ගරු මන්ත්‍රිනී |

**01. ආගම සිහි කිරීම**

2022.10.11 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි, සියලු දෙනාගෙන් අවසරයි. සුපුරුදු පරිදි අදත් ඔක්තෝම්බර් මාසයට අදාල සභා රැස්වීම ආරම්භ කිරීමටයි සූදානම් වෙන්නෙ. පළමුවෙන්ම මම කියන්න ඕන අසනීප තත්වයන් හේතු කොට ගෙන සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි මන්ත්‍රීවරුන්ට වෛද්‍ය සහතික ඉදිරිපත් කොට දීමනාව ලබා ගන්නා ලෙස සිහිපත් කරන ගමන්ම, අද සභා රැස්වීමට පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුළු සියළුම මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන් ඉතාම ගෞරව පූර්වකව පිළිගනු ලබනවා.

**(අ)01. 2022.09.13 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

**(අ)02. පසුගිය වාර්තාවේ සංශෝධන ඉදිරිපත් කිරීම**

2022/09/13 දින පැවති මහා සභා රැස්වීම් වාර්තාවේ (ඌ) වෙනත් කරුණු යටතේ,

ගරු මන්ත්‍රීනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය ගේ කතාව සහ ගරු මන්ත්‍රීනී චන්දිමා දිල්රුක්ෂි මහත්මියගේ කතාව මුද්‍රිත දෝෂයකින් කතා දෙකෙහි නම් දෙක මාරුවී තිබීම හේතුවෙන් එම නම් දෙක සංශෝධනය විය යුතුය.

ඒ අනුව ඉහත සංශෝධනයන්ට යටත්ව **2022.09.13** දින පැවති මහා සභාවේ සභා වාර්තාව සභාව පිළිගත යුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු මන්ත්‍රීනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් යෝජනා කළ අතර, ගරු මන්ත්‍රී සමන් නාපෙ විතානගේ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**(ආ). සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත.

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01.ඩෙංගු මර්ධන ධූමායන කටයුතු සඳහා ඉන්ධන ලබා ගැනීම සම්බන්ධව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, උඩුගම විසින් යොමු කරන ලද 2022.08.22 දිනැති ලිපිය සභාගත කරන ලදී.
ඉහත ලිපිය සම්බන්ධව 2022.10.11 දින සභා වාරයේදී සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, උඩුගම වෙත මාසිකව පෙට්‍රල් ලීටර් 20 ක් ලබා දීම සඳහා අවධානය යොමු කරන ලදී.

02. ආහාර පනත ක්‍රියාත්මක කිරීම සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට 2022 වර්ෂය සඳහා සුළු අක් මුදල් ලබා ගැනීම සම්බන්ධව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, උඩුගම විසින් යොමු කරන ලද 2022.09. දින රහිත MOH/UDU/SPHI ලිපිය සභාගත කරන ලදී.

03.කැප්පිටියාගොඩ උඩවැලිවිටිය යා කරන පටු කොන්ක්‍රීට් පාලම දැනට කඩාවැටීමට ආසන්න තත්ත්වයේ පවතින බැවින් එය ප්‍රතිසංස්කරණය කරදෙන ලෙස ඊ.කේ.එස්.ජයමාන්න, පොලයැල්දූවවත්ත, උඩවැලිවිටිය, ගා/නාගොඩ විසින් යොමු කරන ලද 2022.10.07 දිනැති ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.

**(ඉ). (1) යථා පරිදි කල් දී ඇති යෝජනා**

01. නාගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ තැපැල් ගාස්තු සඳහා මේ වන විට රු 7000.00 ක මුදලක් වෙන්කර ඇති නමුත් 2022.08.15 දින සිට තැපැල් ගාස්තු වැඩිවීම හේතුවෙන් එම රු 7000.00 ක මුදල ප්‍රමානවත් නොවේ. මේ නිසා මෙම මුදල වැඩි කිරීමට යෝජනා කරමි.

**ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රීනී ප්‍රියංගිකා දිල්රුක්ෂි ඒකනායක මහත්මිය විසින් ස්ථිරකරන ලදී.**

**ගරු උපසභාපති එම් .කේ .ගාමිණී සුසන්ත මහතා විසින් තැපැල් ගාස්තු සඳහා රු 10000/= ක මුදලක් සුදුසු යැයි ගරු සභාවට යෝජනා කළ අතර ගරු මන්ත්‍රීනී ප්‍රියංගිකා දිල්රුක්ෂි ඒකනායක මහත්මිය විසින් ස්ථිරකරන ලදී.**

**ඒ අනුව විරෝධතා කිසිවක් නොමැති බැවින් එම සංශෝධිත යෝජනාව ඒකමතිකව සභාසම්මත විය.**

02. 2023 වර්ෂයට ආදායම් රැස්කිරීමට අදාලව 2022 වර්ෂයට සාපේක්ෂව සිදුවන වෙනස්කම් සහ නව යෝජනා සහ අදහස් ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාවට ඉදිරිපත් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා අදහස් දක්වමින් කියා සිටියේ, කරුණු එකින් එක සාකච්ඡා කල යුතු බැවින්, මෙය කමිටුවකට යොමු කර, අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත්ය.**

**ඒ අනුව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපති එම්.කේ. ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

03. 2023 වර්ෂයට නාගොඩ ප්‍රාදේශීය සභාවට අයත් සති පොළවල් ටෙන්ඩර් කිරීමට සුදුසු බව හා අදාළව පොළවල් වල අවම ලංසුව තීරණය කිරීම සම්බන්ධව අදාල යෝජනාව ගරු සභාවට ඉදිරිපත් කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ඒ අනුව ඉහත සඳහන් සති පොළවල් ටෙන්ඩර් කිරීම සම්බන්ධව අවම ලන්සුව අඩුකර තල්ගස්වල පොළ ලක්ෂ 12 ක් ලෙසත් උඩුගම පොළ ලක්ෂ 6 ලෙසත් තීරණය කරන ලද අතර ටෙන්ඩර් කමිටුවකට දමා අනුමත කරගන්නා ලෙස ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා විසින් යෝජනා කරන ලදී.**

**ඒ අනුව ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් සංශෝධිත යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**04.** උඩුගම නැගෙනහිර ගුණානන්ද මාවතේ පියසේන විජේවික්‍රම මහතාගේ නිවස අසල භාවිතයෙන් ඉවත්කර ඇති අඩි පාලමේ යකඩ තහඩු වලින් උඩුගම නැගෙනහිර 219 ග්‍රාම නිලධාරි වසමේ අක්කර 80 ගම්මානයේ ගල්බැදිදොළ නැමැති ඇල හරහා තාවකාලික පාලමක් ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී සමන් නාපෙවිතාන මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**2022.10.11 වන දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව**

**01. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව, නාගොඩ**

I. 2022 සැප්තැම්බර් මස මන්ත්‍රීවරුන් සඳහා ඉන්ධන ලබා ගැනීමේ බිල්පත **- රු. 81,000.00**

II. සභාපතිතුමාගේ රාජකාරි අවශ්‍යතාවයන් සඳහා SPPF 7360 අංක දරණ කැබ් රථය අධිවේගී මාර්ගයේ ගමන් කිරීම වෙනුවෙන් මුදල් ප්‍රතිපූර්ණය කිරීම **- රු. 700.00**

**02. චන්දිමා සෙනෙවිරත්න මිය, ලේකම්, නාගොඩ ප්‍රාදේශීය සභාව** **- රු. 9,164.66**

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක **sp/psc/07/01/08(37)** හා 2022.02.07 දිනැති ලිපිය අනුව ලේකම් තනතුරෙහි වැඩ බැලීම වෙනුවෙන් සැප්තැම්බර් මස දීමනා ගෙවීම

**03. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය, අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල**

2009 වර්ෂයෙන් ඉතිරි විගණන ගාස්තු ගෙවීම **- රු. 16,170.00**

**04. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව,මුද්දර බදු අංශය,කොළඹ 02** **- රු. 8,050.00**

2021.10.01 සිට 2021.12.31 දක්වා ව්‍යාපාර බලපත්‍ර සඳහා මුද්දර බදු පියවීම -රු. 3625.00

2021.10.01 සිට 2021.12.31 දක්වා වැටුප්වලින් අයකර ගත් මුද්දර බදු පියවීම-රු. 4,425.00

-

**05. නීතිඥ හේමන්ත ජී.ඩබ්. විතාරණ මයා, අංක 24, ලේන්බාන් වීදිය, කොටුව.**

**I. 2022/09/14 දින P- 15977 නඩුවට අදාළව පෙනී සිටීමේ නීතිඥ ගාස්තු** **-රු. 3,500.00**

**II. 2022/09/20 දින P- 14658 නඩුවට අදාළව පෙනී සිටීමේ නීතිඥ ගාස්තු** **-රු.8,500.00**

**06. ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව, ගාල්ල** **- රු. 48,570.00**

මාපලගම නිදහස් ආයුර්වේද මධ්‍යස්ථානයට බෙහෙත් ද්‍රව්‍ය මිළදී ගැනීමේ බිල්පත

**07. ඞී.ආර්. ශ්‍යාමන් සෝමසිරි මයා, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, ගාල්ල** **-රු.500.00**

SPRA 8570 ට්‍රැක්ටරයේ අළුත්වැඩියාව සම්බන්ධයෙන් පරික්ෂා කර බලා පෙර වාර්තාව ලබා දීම වෙනුවෙන් ගෙවීම

**08. එල්. එස්. ආර්. විජේතිලක, නාගොඩ, ගාල්ල** **- රු. 6,000.00**

නාගොඩ කැකුලු පෙර පාසල පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල සඳහා 2022 ඔක්තෝම්බර් මස බදු කුලිය ගෙවීම

**09. එම්.ජේ. ජනිත් ඉරේෂ්, කුමාර, ජාගොඩ කේක් ඇන්ඩ් ස්වීට්ස්, ඉහළ ලේලවල, ගා/ වදුරඹ** **-රු. 13,213.00**

2022.09.13 දින පැවති මහ සභා වාරය සඳහා සංග්‍රහ වියදම් බිල්පත පියවීම

**10. ඒ.කේ නිලන්ති සජීවනී, ග්‍රාෆ්ටෙල් කොමියුනිකේෂන්, යටලමත්ත.**

i. 2022 සැප්තැම්බර් මස සභා වාර්තා පිටපත් 28ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් බිල්පත් පියවීම **-රු. 4,564.00**

ii. 2022 සැප්තැම්බර් මස මන්ත්‍රීවරුන් සඳහා දුරකතන කාඩ්පත් ලබා ගැනීමේ බිල්පත පියවීම **-රු.28,500.00**

**11. ඒ.ඩී. කරුණාරත්න, සරත් ස්ටෝර්ස්, යටලමත්ත,ගාල්ල** **-රු. 9,330.00**

2022 සැප්තැම්බර් මාසය සඳහා නාගොඩ මහජන පුස්තකාලයට පුවත්පත් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම

**12. එච්. එල්. කේ. ශ්‍රීනිත් රුක්ෂාන්, සමගිගම, උඩුගම දකුණ, ගා/උඩුගම**

2022 සැප්තැම්බර් මාසය තුළ දී උඩුගම මහජන පුස්තකාලයට පුවත්පත් සැපයීම වෙනුවෙන් බිල්පත් පියවීම **-රු. 7,580.00**

**13. බී.ජේ. කරුණාරත්න, රත්නගිරි ස්ටෝර්ස්, මාපලගම** **-රු. 30,180.00**

මාපලගම මහජන පුස්තකාලයට පුවත්පත් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම

| | |
|---|---|
| **2022 මැයි** | **- රු. 6,300.00** |
| **2022 ජුනි** | **- රු. 6,850.00** |
| **2022 ජූලි** | **- රු. 4,500.00** |
| **2022 අගෝස්තු** | **- රු. 6,060.00** |
| **2022 සැප්තැම්බර්** | **- රු. 6,470.00** |

**14. සවුන්ඩ් ටෙක්නොලජීස් ප්‍රයිවට් ලිමිටඩ්, වක්වැල්ල, ගාල්ල** **-රු. 39,300.00**

Canon LBP 6030 වර්ගයේ මුද්‍රණ යන්ත්‍ර 02ක් හා HP P1005 මුද්‍රණ යන්ත්‍රය අලුත්වැඩියා කිරීමේ බිල්පත පියවීම

**15. ජී.පී. සඳුන් චතුරංග, E-Base කම්පියුටර් ටෙක්නොලජි, ඇතුමලේ**

I. නාගොඩ පුස්තකාලයේ පරිගණකය සඳහා මෙහෙයුම් පද්ධතිය (operation system -OS) යෙදීමට අදාළ බිල්පත පියවීම **- රු.1,750.00**

II. පරිගණක සඳහා ටෝනර් කාට්ලේජ ලබා ගැනීමේ බිල්පත පියවීම **- රු. 332,500.00**
( ගෙවීම් සිදු කිරීමෙන් පසුව භාණ්ඩ සැපයීම සිදු කරන බව සැපයුම්කරු දන්වන ලදී.)

**16. නානායක්කාර හාඩ්වෙයාර්, නාගොඩ, ගාල්ල**

**i.** ගිණුම් අංශයේ ඇති විදුලි පංකාව අළුත්වැඩියා කිරීමට සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීමේ බිල්පත **- රු. 1,525.00**

ii. ප්‍රධාන කාර්යාලයේ කෑම කාමරයේ සින්ක් එකේ ජල කරාමය සෑදීමේ බිල්පත **- රු. 710.00**

iii. ප්‍රධාන කාර්යාලයේ වතුර මෝටරය අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍යය ද්‍රව්‍ය ලබා ගැනීමේ බිල්පත **-රු. 2,070.00**

**17. සමන් කුමාර මහතන්ත්‍රි, සමන් ඉන්ජිනියර්ස්, යටලමත්ත, ගාල්ල** **- රු.4,800.00**

ප්‍රධාන කාර්යාලයේ වතුර මෝටරයේ දෙපස බට සඳහා ෂොකට් පැස්සීමට අදාළ බිල්පත පියවීම

**18. සන්සේයා ස්ටුඩියෝ, නාගොඩ, ගාල්ල** **රු.3,600.00**

ප්‍රධාන කාර්යාලය හා උප කාර්යාලවල නිලධාරීන්ගේ කාර්යාලීය හැඳුනුම්පත් සෑදීම සඳහා

**18.ඒ.ජේ.ජී. ස්ටේෂනර්ස්, නො.1/10, කොළඹ පාර,කලුවැල්ල, ගාල්ල**

**i.** ප්‍රධාන කාර්යාලයට අවශ්‍ය ලිපිද්‍රව්‍ය ලබා ගැනීමේ බිල්පත (2022.10.04 දින) **- රු. 51,575.00**

ii. ප්‍රධාන කාර්යාලය සහ උප කාර්යාල සඳහා අවශ්‍ය ලිපිද්‍රව්‍ය ලබා ගැනීමේ බිල්පත (2022.09.16 දින) **- රු. 75,820.00**

**19. ඩී.ජී.කැළුම් පුෂ්පකුමාර මයා, කෙලින් වීදිය, උඩුගම**

i. SPLL 7103 ටිපර් රථයේ අළුත්වැඩියාව සම්බන්ධ බිල්පත පියවීම **- රු. 8,600.00**

ii. SPLL 7650 කෘ කැබ් රථයේ ගියර් කේබල් බ්‍රැකට් එක සාදා සවි කිරීමේ බිල්පත පියවීම **- රු. 800.00**

iii. 252- 6478 අංක දරණ කැබ් රථයේ හීටර් රිලේ එක මිලදී ගැනීමට හා වයර් පද්ධතිය පරීක්ෂා කර සැදීම සඳහා බිල්පත පියවීම **-රු. 4,450.00**

**20. අබේනායක ඔටෝ සර්විස්, වක්වැල්ල පාර, ගාල්ල. - රු. 37,620.00**

SPPF 7360 අංක දරණ කැබ් රථය සේවා කිරීමේ බිල්පත පියවීම

**21. නිව් විජය මෝටර්ස්, ඔරොප්පුවත්ත,ගාල්ල -රු. 1,300.00**

**SPPF 7360** කැබ් රථයේ එලයිමන්ට් චෙක් කිරීමේ බිල්පත පියවීම

**22.කේ.ටී.ආර්.ජී.උමාල් කිරිඇල්ල, ග්‍රෑන්ඩ් මෝටර්ස්, වදුරඹ - රු.11,350.00**

SPPF 7360 අංක දරණ රථය සඳහා දුණු කොලයක් අලුතින් දැමීමේ බිල්පත පියවීම

**23.**ලංකා තෙල් පිරවුම්හල, නාගොඩ **- රු. 166,750.00**

**I.** නාගොඩ ප්‍රාදේශීය සභාවේ වාහන සහ අනෙකුත් අවශ්‍යතා සඳහා ඉන්ධන ලබා ගැනීමේ බිල්පත පියවීම **(2022** ජූලි මාසය සඳහා)

| දිනය | වාහන අංකය | ඇණවුම් අංකය | වර්ගය | ප්‍රමාණය (l) | වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|
| 2022.07.12 | PF 7360 කැබ්රථය | 370301 | ඩීසල් | 60 | 26,400.00 |
| 2022.07.29 | | 370306 | | 50 | 22,000.00 |
| | | | එකතු | **110** | **48,400.00** |
| 2022.07.12 | 252-6478 කැබ් රථය | 370303 | ඩීසල් | 22 | 9,680.00 |
| 2022.07.29 | | 370308 | | 50 | 22,000.00 |
| | | | එකතුව | **72** | **31,680.00** |
| 2022.07.29 | LL 7366 ට්‍රක් ජල බවුසරය | 370307 | ඩීසල් | 50 | 22,000.00 |
| | | | එකතුව | **50** | **22,000.00** |
| 2022.07.07 | SPRA 8570 ට්‍රැක්ටරය | 370300 | ඩීසල් | 20 | 8,800.00 |
| 2022.07.12 | | 370302 | | 38 | 16,720.00 |
| 2022.07.24 | | 370304 | | 20 | 8,800.00 |
| 2022.07.29 | | 370309 | | 40 | 17,600.00 |
| | | | එකතුව | **118** | **51,920.00** |
| 2022.07.28 | ගබඩා කිරීම සඳහා | 370305 | පෙට්‍රල් | 25 | 11,250.00 |
| | | | එකතුව | **25** | **11,250.00** |
| 2022.07.28 | ගබඩා කිරීම සඳහා | 370305 | 2T oil | 01 | 1,500.00 |
| | | | එකතුව | **01** | **1,500.00** |

| | | | |
|---|---|---|---|
| මුළු එකතුව | **(ඩීසල්)** | **375** | |
| | **(2T ඔයිල්)** | **01** | **166,750.00** |

**II.** ලංකා තෙල් පිරවුම්හල, නාගොඩ

නාගොඩ ප්‍රාදේශීය සභාවේ වාහන සහ අනෙකුත් අවශ්‍යතා සඳහා ඉන්ධන ලබා ගැනීමේ බිල්පත පියවීම **(2022** අගෝස්තු මස) **- රු. 282,020.00**

| දිනය | වාහන අංකය | ඇණවුම් අංකය | වර්ගය | ප්‍රමාණය (l) | වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|
| 2022.08.03 | PF 7360 කැබ්රථය | 370311 | ඩීසල් | 58 | 24,940.00 |
| 2022.08.05 | | 370312 | | 20 | 8,600.00 |
| 2022.08.15 | | 370316 | | 60 | 25,800.00 |
| 2022.08.19 | | 370321 | | 43 | 18,490.00 |
| 2022.08.28 | | 370326 | | 70 | 30,100.00 |
| | | | **එකතුව** | **251** | **107,930.00** |
| 2022.08.11 | 252-6478 කැබ් රථය | 370313 | ඩීසල් | 23 | 9,890.00 |
| 2022.08.15 | | 370318 | | 50 | 21,500.00 |
| 2022.08.29 | | 370327 | | 20 | 8,600.00 |
| | | | **එකතුව** | **93** | **39,990.00** |
| 2022.08.03 | LL 7650 කෘ කැබ් රථය | 370310 | ඩීසල් | 50 | 21,500.00 |
| 2022.08.15 | | 370319 | | 30 | 12,900.00 |
| | | | **එකතුව** | **80** | **34,400.00** |
| 2022.08.16 | LL 7366 ට්‍රක් ජල බවුසරය | 370320 | ඩීසල් | 15 | 6,450.00 |
| 2022.08.21 | | 370322 | | 20 | 8,600.00 |
| 2022.08.28 | | 370323 | | 50 | 21,500.00 |
| | | | **එකතුව** | **85** | **36,550.00** |
| 2022.08.12 | SPRA 8570 ට්‍රැක්ටරය | 370314 | ඩීසල් | 20 | 8,600.00 |
| 2022.08.15 | | 370317 | | 40 | 17,200.00 |
| 2022.08.30 | | 370325 | | 20 | 8,600.00 |
| | | | **එකතුව** | **80** | **34,400.00** |
| 2022.08.12 | LL 7103 ටිපර් රථය | 370315 | ඩීසල් | 05 | 2,150.00 |
| 2022.08.28 | | 370324 | | 50 | 21,500.00 |
| | | | **එකතුව** | **55** | **23,650.00** |
| 2022.08.30 | | 370325 | DS 40 oil | 03 | 5,100.00 |
| | | | **එකතුව** | **03** | **5,100.00** |
| **මුළු එකතුව (ඩීසල්)** | | | | **647** | |
| **මුළු එකතුව (DS 40 oil)** | | | | **03** | **282,020.00** |

24. **යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය, ආනන්දගිරි, නාගොඩ , ගාල්ල** **-** රු. 14,500.00
සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී දීමනාව ගෙවීම (2022 සැප්තැම්බර් මස සඳහා)

**<u>සේවක ණය</u>**

25.**දස මස වැටුප් අත්තිකාරම් මුදල් ලබා ගැනීම**

| | | |
|---|---|---|
| එච්.ජී. මල්කාන්ති මිය | - පෙර පාසල් ගුරු | - රු. 250,000.00 |

26. **<u>2022 සැප්තැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා)</u>**

| | | | |
|---|---|---|---|
| I. | කේ.ජී. මානෙල් සුදර්ශනී මිය | - සංවර්ධන නිලධාරී | -රු. 6,200.00 |
| II. | කේ.ඩී.එස්. නිපුනිකා මිය | - සංවර්ධන නිලධාරී | -රු. 6,200.00 |
| III. | ඩබ්.ජේ.ඒ. ශානක මයා | -ආදායම් පරීක්ෂක | -රු. 4,000.00 |

**27.<u>2022 අගෝස්තු මස ගමන් වියදම්</u>**

| | | | |
|---|---|---|---|
| I. | කේ.ජී.ඩී.ඩී. සේනාරත්න මයා | - සංවර්ධන නිලධාරී | -රු.1,750.00 |

**28. <u>2022 සැප්තැම්බර් මස ගමන් වියදම්</u>**

| | | | |
|---|---|---|---|
| I. | නිමල් වික්ටර් නාගොඩවිතාන මයා | -සභාපති | - රු. 2,000.00 |
| II. | චන්දිමා සෙනෙවිරත්න මිය | - වැ.බ ලේකම් | -රු. 1,820.00 |
| III. | කේ.ජී. අනුෂා කුමාරි මෙය | - සංවර්ධන නිලධාරී | -රු. 350.00 |
| IV. | කේ.ජී.ඩී.ඩී. සේනාරත්න මයා | - සංවර්ධන නිලධාරී | -රු.2,800.00 |
| V. | කේ.ඩී.එස්. නිපුනිකා මිය | - සංවර්ධන නිලධාරී | -රු.2,870.00 |
| VI. | ඊ. ආර්.බී. ගුණවර්ධන මිය | - සංවර්ධන නිලධාරී | -රු. 1,178.00 |
| VII. | ටී. සෙව්වන්දි මිය | - පුස්තකාලයාධිපති | -රු. 700.00 |
| VIII. | කේ.එල්. නදුන් ප්‍රමෝද් මයා | -තාක්ෂණ නිලධාරී | -රු. 948.00 |
| IX. | අනුෂා සමරවික්‍රම මිය | - තාක්ෂණ නිලධාරී | -රු 700.00 |
| X. | ඩබ්.ජේ.ඒ. ශානක මයා | -ආදායම් පරීක්ෂක | - රු.2,240.00 |
| XI. | වයි.ජී. ගංගා මෙය | - පුස්තකාල සහායක | - රු. 700.00 |
| XII. | කේ.කේ. අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | -රු. 700.00 |
| XIII. | එම්.ඒ. වසන්ත මයා | -රියදුරු | - රු. 3,500.00 |
| XIV. | අනුර දිසානායක මයා | -රියදුරු | -රු . 1,750.00 |
| XV. | ඩබ්.එම්.ජී. තරංගා දිල්රුක්ෂි මිය | -වැ.කේ. කම්කරු | -රු. 700.00 |
| XVI. | කැලුම් චාමර මයා | - රියදුරු | - රු. 700.00 |

**29. <u>2022 ඔක්තෝම්බර් මස ගමන් වියදම්</u>**

| | | | |
|---|---|---|---|
| I. | කේ.කේ. අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | -රු. 620.00 |

**30. <u>අතිකාල දීමනා ගෙවීම්</u>**

| | | | |
|---|---|---|---|
| i. | එම්.ඒ.වසන්ත මයා | - රියදුරු | **- රු.** 9,226.00 |
| ii. | අනුර දිසානායක මයා | -රියදුරු | -රු. 6,270.00 |
| iii. | කේ. එච්.එම් නිශාන්ත ඉඳුනිල් | - රියදුරු | - රු. 8,560.00 |
| iv. | කේ.එච්.එම්. කැලුම් චාමර මයා | - රියැදුරු | -රු.2,782.00 |
| v. | ඩී.ටී.ආර්.ඒ. තරිදු ගුණරත්න මයා | - මුරකරු | - රු. 6,179.00 |
| vi. | යසරත්න විජේසේකර මයා | - මුරකරු | - රු.5,040.00 |
| vii. | ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු.8,346.00 |
| viii. | එන්.එම්.රජිත් මයා | - අනියම් මුරකරු | - රු.4,848**.00** |
| ix. | යූ.ජී.රංජිත් උදය කුමාර මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | -රු.1,404.00 |
| x. | අයි.කේ.ඉන්දික මයා | -මාර්ග කම්කරු | -රු.3,465.00 |

| | | | |
|---|---|---|---|
| xi. | කේ.ජී.හර්ෂ චාමර සම්පත් මයා | - සෞඛ්‍ය කම්කරු | -රු.4,545.00 |
| xii. | යූ.ජී. ආසිරි අභය කුමාර මයා | - සෞඛ්‍ය කම්කරු | -රු.4,242.00 |

<u>සභා අරමුදල්</u>

**31. පසන් එන්ටර්ප්‍රයිසස්, වදුරඹ, බද්දේගම. -රු.2,500.00**

තුන්හවුල්කැල්ල මහගෙදරවත්ත මාර්ගය සිලිංඩර යොදා සංවර්ධනය කිරීම සඳහා
ජේ.සී.බී. යන්ත්‍රය යොදා ගැනීම වෙනුවෙන් ගෙවීම් (ජේ.සී.බී පැය 1 ක් සඳහා)

**(ඉ)2.රැස්වීම් රීති 11(8) යටතේ ඉදිරිපත් කරන යෝජනා**

05 . ප්‍රධාන කාර්යාලයේ පරිහරණය කරන වැසිකිලි පද්ධතියේ වැසිකිලි වල මේ වන විට මාස දෙකක් ඇතුලත දෙපාරක් අපද්‍රව්‍ය ඉවත් කිරීමට සිදුවී ඇති බැවින් අපද්‍රව්‍ය ඉවත් වන නළ පද්ධතිය නිසියාකාරව ජලය බැස නොයාම බව තාක්ෂණික නිලධාරීන් මා වෙත වාර්තා කර ඇත. එබැවින් නව ජල අපවාහන පද්ධතියක් සකස්කල යුතු බව ගරු සභාවට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

06. 2022 ඔක්තෝම්බර් මස සාහිත්‍ය මාසය මුල්කර ගනිමින් පාසල් දරුවන් ට අධ්‍යාපන වැඩසටහනක් හා පුස්තකාල පාඨකයන් අතරින් නිවෙස්වල ගෘහනියන් සම්බන්ධකර ගනිමින් වැඩමුළුවක් පැවැත්වීමට රු.25,000.00 ක මුදලක් සභා අරමුදලින් වියදම් කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු උපසභාපති එම්.කේ ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

07.සභාව සතු 252-6478 අංක දරණ කැබ් රථය පණ ගැන්වීමෙදී ඇති දෝෂය (රියදුරුගේ ඉල්ලීමේ ලිපියට අනුව ඉන්ජෙක්ටර් පොම්පයේ ඇති දෝෂය) පිළිබඳ ඉංජිනේරු වාර්තාවක් රැගෙන අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාවට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

08. නාගොඩ ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙනයනු ලබන පහත සඳහන් ගිණුම් වලට අදාල චෙක්පත්වල දෙවන අත්සන්කරු ලෙස කටයුතු කරනු ලබන පී.කේ මධුෂානි වාසනා මිය ස්ථානමාරු ලැබීමට නියමිත බැවින් චෙක්පත් අත්සන් කිරීමේ බලතල අවලංගු කොට නදීෂා ප්‍රබෝධනී මියට චෙක්පත්වල දෙවන අත්සන්කරු ලෙස බලය පැවරීමට යෝජනා කරමි.

- තල්ගස්වල මහජන බැංකුව (පොදු අරමුදල්) - 272100110000027
- තල්ගස්වල මහජන බැංකුව (සේවක ණය) - 272100150000030
- තල්ගස්වල ලංකා බැංකුව (රජයේ ආධාර) - 0004766271

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේර ආරච්චි මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

09.නාගොඩ ප්‍රාදේශීය සභාව යටතේ පාලනය වන පෙරපාසල් 13 ක සේවය කරන සහයක ගුරුතුමියන් 14 දෙනෙකු සඳහා රු 2500/= ක දීමනාවක් ලබා දීමට ගරු සභාවට යෝජනා කරමි.

**ගරු චන්ද්‍ර සහබන්දු මහතා අදහස් ඉදිරිපත් කරමින්**

පෙරපාසල් වාර්තාව ඉදිරිපත්කර එම වාර්තාව ලබන සභාවට යොමුකර ඒ අනුව කටයුතු කරන්න. (ඩිප්ලෝමා සහතික තිබේද? / භාහිරව මුදල් එකතු කරන ගණන )

**එ අනුව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව සභා සම්මත නොවුනි.**

10.උඩුගම හා තල්ගස්වල පොළේ කඩවලින් අය කරන කඩබදු දැනට ප්‍රාදේශීය සභාවේ ගිණුමට බැරවන අතර නව ගිණුමක් ආරම්භකොට එකී පොළ දෙකෙහි ආදායම එම ගිණුමට බැරකරන ලෙසත් එකී ආදායමෙන් පොළ දෙකෙහි සංවර්ධන කටයුතු වෙනුවෙන් හා ප්‍රදේශයේ යටිතල පහසුකම් සංවර්ධනය සහ විශේෂයෙන්ම ප්‍රාදේශීය සභාව යටතේ පාලනය වන පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන (පෙරපාසල්) සංවර්ධනය වෙනුවෙන් යොදා ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

11. 2022.03.23 දින ඇප්තොප්වත්තට පැමිණි කෘෂිකර්ම නිලධාරීන් විසින් දිගුකාලීන මධ්‍ය කාලීන හා කෙටි කාලීන වගාවන් සිදු කිරීමට උපදෙස් දෙන ලදී. ඒ අනුව ඒ සඳහා එක් පියවරක් ලෙස අන්නාසි වගාව සිදු කිරීමට උපදෙස් දෙන ලදී. ඒ අනුව ඒ සඳහා එක් පියවරක් ලෙස අන්නාසි වගාව සිදු කිරීමට අවශ්‍ය භූමිය සකස් කිරීම මේ වන විට සිදු කරමින් පවතින අතර ඒ සඳහා අවශ්‍ය අන්නාසි පැළ 500 ක පමණ ප්‍රමාණයක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදෙන ලෙස යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

12. උඩුගම පොළ අසල දැනට පවත්වාගෙන යනු ලබන ත්‍රීරෝද රථගාල පවත්වාගෙන යාම සඳහා ලියාපදිංචිය ලබා ගැනීමට ගරු සභාවේ අවසරයද මේ සඳහා ලබා දෙන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී සමන් නාපෙවිතාන මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**02.ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

01. ඉදිවන ආදාහනාගාරය වටා මායිම් වැටක් ඉදි කිරීම - රු. 650,000.00
02. ඇටඹගහවිල කෘෂි මාර්ගයේ දොළේකඩේ පිවිසුම අසළ සපත්තු පාලම ඉදි කිරීම - රු. 375,000.00
03. ප්‍රධාන කාර්යාලයේ නව ජල අපවාහන පද්ධතිය සකස් කිරීම - රු. 98,600.00

04. ඇප්ත්‍රොප්වත්ත ඉඩමේ නොදිරණ කසළ බැහැර කිරීම සඳහා
ජේ.සී.බී. යන්ත්‍රයක් භාවිතයෙන් කුණු වලක් සැකසීම - රු. 25,000.00
05. නාගොඩ මහජන පුස්තකාලයේ තරප්පු පෙළ අසළ
ආරක්ෂිත වැටක් ඉදි කිරීම - රු. 45,500.00

**ඉහත සඳහන් ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට විසින් ගරු මන්ත්‍රිනී ප්‍රියංගිකා දිල්රුක්ෂි ඒකනායක මහත්මිය යෝජනා කල අතර, ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**03. මිළ ගණන් ඉදිරිපත් කිරීම**

**නාගොඩ ප්‍රාදේශීය සභාවේ RD 1637 ට්‍රැක්ටරය අළුත්වැඩියා කිරීම සඳහා මිළ ගණන්**

| **අනු අංකය** | **විස්තරය** | **උඩුගම මෝටර් ඉංජිනියර්ස්, උඩුගම** | **නිව් යූනියන් මෝටර් වර්ක්ස්, ගාල්ල** | **අමින්ද මෝටර්ස්, උඩුගම** |
|---|---|---|---|---|
| 01 | RD 1637 ට්‍රැක්ටරය අළුත්වැඩියා කිරීම | රු. 139100.00 | රු. 149400.00 | රු.147500.00 |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ RD 1637 ට්‍රැක්ටරය අළුත්වැඩියා කිරීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කරන ලද උඩුගම මෝටර් ඉංජිනියර්ස්, උඩුගම වෙතින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ RD 1637 ට්‍රැක්ටරය අළුත්වැඩියා කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් යෝජනා කරනු ලදුව, ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.

**(ඊ) කාරක සභා වාර්තා**

01. 2022.09.27 වන දින පවත්වන ලද ප්‍රසම්පාදන කමිටු වාර්තාව සභාව පිළිගත යුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

නැත.

**(ඌ) වෙනත් කරුණු**

**ගරු මන්ත්‍රිනී කේ.කේ. ඉනෝකා නෙරංජලී මිය.**
ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. සභාපතිතුමනි එක් මන්ත්‍රීවරයෙකුට බල්බ් 05 ක් දෙනව කියල තියෙනවා. එහි සත්‍ය අසත්‍යතාවය කුමක්ද කියල දැනගන්න කැමතියි.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**
සභා අනුමැතියකුත් ලැබිල ඇතිනෙ. ඔව් ඉදිරියෙදි දෙන්න කටයුතු කරන්නම්.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපති තුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. පසුගිය දිනවලදී සමගි ජන බල වේගයේ හිනිදුම ආසනයේ බල මණ්ඩල රැස්වීම පැවැත්තුවා. එයට සජිත් ප්‍රේමදාස මහත්තයත් සහභාගි වුනා. එම රැස්වීමට මිනිස්සු 3000 ක් විතර සහභාගි වෙලා හිටියා. මම ඔබතුමාලටත් අභියෝගකරනව මෙවැනි පිරිසක් එකතු කරල බලමණ්ඩල රැස්වීමක් තියන්න කියලා . අනෙත් අය විවිධ කෝණවලින් බැලුවත් එදින අපේ අජිත් මහත්තය අපේ  සමගි ජන බල වේගය සමග එකතුවුනා. ඒ ගැන සතුට පලකරන ගමන්ම තවත් මට හයියක්වුනා. ඒ වගේම සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටිනව පක්ෂපාථ නොබලා අපිත් සමග එකතු වෙන්න කියල. මිනිස්සුන්ට ජීවත් වෙන්න බැරි වටපිටාවක් තියෙන්නේ. ඒ වගේම නවයුගයක් අරඹන්න වටපිටාවක් සකස් වෙලා තියෙන්නේ. නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්‍යාලය මගින් මාපලගම සමෘද්ධි කාර්‍යාලයට යාබදව තල්ගස්වල වත්තට අයත් ඉඩම් කට්ටි කොටසෙහි ඇති දර කපන්න ටෙන්ඩර් කරලා පුද්ගලයකුට දීලා තියෙනවා. ගම් පුළුල් කිරීමේ වැඩසටහන යටතේ එක එක්කෙනාට කැබලි දෙන්න නෙවෙයි තියෙන්නෙ. ඉඩම් කච්චේරි තියලා, ලේඛනවල පිළිවෙලට සාධාරණ ලෙස බෙදිය යුතුයි.  වැන්දඹු කාන්තාවන් වැනි ගෙවල් දොරවල්, ඉඩ කඩම් නොමැති ඉතා අසරණ පුද්ගලයන් පවා ඉන්නවා.  මෙතන මොන විදිහට ඉඩම් බෙදනවා ද කියලා බලන්න ඕන. බලහත්කාරයෙන් අත්පත් කරගත්තොත්, ඒ පිළිබඳව සොයා බලන්න කියලා මම ප්‍රකාශ කරනවා.
ඒ වගේම අද රට ගමන් කරන ආකාරය බැලුවොත්,  දැවැන්ත අර්බුද රැසකට මුහුණ දෙන්න වෙලා තියෙනවා. නමුත්   එම අර්බුධවලින්ම රට මුදවාගෙන රට යහපත් තත්වයක් කරා ගමන් කරවීමට උපරිම සහයෝගය ලබා දෙමින්,  මම නිහඩ වෙනවා. ඔබ සියලු දෙනාටම බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

තල්ගස්වල ඉඩම බෙදා දීම සම්බන්ධව  නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ලිපියකින් අපව දැනුවත් කර තිබුණා.  එම  ඉඩම් කට්ටි කොටස්වලින් මාර්ග මුහුණතෙහි පිහිටි ඉඩම් කැබලි ව්‍යාපාරික කටයුතු වෙනුවෙන් වෙන්දේසි කිරීම සඳහා ප්‍රාදේශීය සභාවට ලබා දීමට සුදුසු බව දන්වා තියෙනවා. ඒ සම්බන්ධව දේශපාලන මැදිහත් වීමක් නැහැ.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. පසුගිය සභා වාරයේදී කතා කළ ඉහලගම උඩුගම හරහා කරාපිටිය දක්වා ධාවනය වන  බස් රථය ලබා දුන්නා. ඒ සම්බන්ධව උනන්දු වී කටයුතු කල නිලධාරීන්ට ස්තූතිය පුද කරන ගමන්ම, උඩුගම ප්‍රාථමික විද්‍යාලයේ ගේට්ටුව ඉදිරිපිට කානුපද්ධතියක් නොමැතිවීමත්, අධික වර්ෂාපතනය නිසා අතුරුපාරකින් ජලය ගලාබැසීමත් හේතුකොටගෙන එම ස්ථානයේ ජලය එක්රැස්වීම සිද්ධවෙනවා. ඒ නිසා පාසල් යන ළමුන්ට දැඩි දුෂ්කරතාවයන්ට මුහුණපාන්න සිදුවෙලා තියෙනවා. මේ සම්බන්ධව දකුණු පළාත්  මාර්ග සංවර්ධන අධිකාරියට දැනුවත් කිරීමක් කරන්න තාක්ෂණ නිලධාරීන් යොදවලා පරීක්ෂාකර අවශ්‍ය පියවර ගන්න කියලා ඉල්ලා සිටින අතර, මටද පිටපතක් යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම උගරල  ස.තො.සේ  ආකාරයට උඩුගම ස.තො.සෙනුත් ඉවතලන අපද්‍රව්‍ය ලබා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කරන්න. අඩුම ගානෙ යම් කිසි මුදලක් හරි අයකරගෙන එය ක්‍රියාත්මක කරන්න කියලා ගරු සභාවෙන් මම ඉල්ලා සිටිනවා. ඒ වගේම අපේ සහෝදර වනමල් මන්ත්‍රිතුමා එක්සත් ජාතික පක්ෂයට සැපත් වෙලා ඕනවාටක් වඩා නිදහස පාවිච්චි කරනවා. ඒ විතරක් නොවෙයි  වෙනත් පක්ෂයක සහෝදර මන්ත්‍රීවරයාට සුබ පතනවා.

සභාවේ කතා වුන පෙර පාසල් සහය පාලිකාවන් වෙනුවෙන් රු. 2500.00 ක නව දීමනාවක් ලබා දීම සම්බන්ධයෙන් වූ යෝජනාව  ස්ථිර කරන එක, එය කළ යුතු දෙයක්. අපි ඔවුන්ට ලබාදෙන්න පුළුවන්

සහයෝගය ලබා දිය යුතුයි. නමුත් එය නීත්‍යානුකූලව කළ යුතුයි. උඩුගම පෙර පාසල අනෙක් පුද්ගලික පෙර පාසල් අභිබවා ඉදිරියෙන් සිටිනවා. එම නිසා සහය පාලිකාවන්ට මෙම දීමනාව ලබාදෙනවා නම් සුදුසුයි.

උඩුගම උප කාර්යාලයේ සභාවට ලැබුණු වාහන ගරාජ් කරලා තියෙනවා. සභාවට යම් ආදායමක් ලබාගන්න කටයුතු කරන්න. මොකද නැත්නම් වාහන ප්‍රයෝජනයට නොගෙන ගාල් කර තැබීමෙන් එම වාහනවල බැට්‍රි බහිනවා. ඇත්තටම මෙලෙස වාහන නිකරුනේ ගාල් කර තිබීම මහා අපරාධයක්. සුළු සුළු දෝෂ ඇති වාහන හඳුනාගෙන ඒවා අළුත්වැඩියා කර අප බල ප්‍රදේශයට ඉන් ප්‍රයෝජන අවශ්‍ය නොවනවනම්, බල ප්‍රදේශයෙන් බාහිරව හරි කුමන හෝ කටයුත්තකට යොදවලා සභාවට ආදායමක් ගන්න සුදුසු වැඩපිළිවෙලක් හදන්න කියලා මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා. වාහන සම්බන්ධව සුදුසුකම් ඇති කමිටුවක් පත්කරලා ක්‍රමවත් විදිහට උනන්දු වෙලා බුද්ධිමත්ව කටයුතු කරන්න කියලා නැවතත් කියනවා. ඒ වගේම 369 උඩුගම -බද්දේගම පැරණිම මාර්ගයක්. නමුත් හවස 3.20 - 5.20 දක්වා ගමන් කරන්න බස් රථයක් නැහැ. නමුත් මේ කාලසීමාව තුල අධික මගීන් පිරිසක් සිටින නිසා එම කාල සීමාව තුල බස් රථය ධාවනයේ යෙදවීම සඳහා අවශ්‍ය ආයතන දැනුවත් කිරීම් කටයුතු කරන්න කියලා මේ අවස්ථාවේදී ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා**

පසුගිය කාලවකවානුව තුල කතා කරපු උඩුගම ඉහළගම බස් රථය සම්බන්ධයෙන් ප්‍රාදේශීය සංවර්ධන කමිටු රැස්වීම් රැසක කතා කළත්, හොඳ ප්‍රතිඵලයක් ලැබුනෙ නැහැ. නමුත් මෙම සභාවෙ නිලධාරීන් විසින් අදාළ ආයතන දැනුවත් කොට එම අදාළ බස් රථය අප ප්‍රදේශයට ලබා දී තියෙනවා. ඒ සම්බන්ධව එම කටයුතු කල නිලධාරීන්ට ස්තූතිය පුද කරනවා. නමුත් ඒ සම්බන්ධයෙන් කිව යුතු තවත් කරුණක් තියෙනවා. එම ඉහළගම උඩුගම හරහා කරාපිටිය දක්වා ගමන් කරන බස් රථය ධාවනයේ යෙදෙව්වත්, අවශ්‍ය කාල සටහන අනුව ධාවන නොවන බව පෙනී යන නිසා ඒ පිළිබඳවත් එම අදාළ ආයතන දැනුවත් කොට නියමිත කාල සටහනකට අනුව බස් රථය අඛණ්ඩව ධාවනයේ යෙදවීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන්න කියලා ඉල්ලා සිටිමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රිනී ගයන්ති කුමාරි මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුළුව සමස්ත සභාවෙන් අවසරයි. ගිය සුමානේ ඇප්තොප්වත්තේ අඹ පැළ සිටුවලා තියෙනවා. නමුත් එහි ඵලදාව ලැබෙන විට එහි අයිතියක් තියේවිද කියලා මට දැනගන්න අවශ්‍යයි. දැනට තිබෙන පොල්, කොස්, රබර් අපේ නෙමෙයි. නමුත් තියෙන පොල් ගස් දැන් ඵලදාව අඩු වෙලා තියෙන නිසා නැවතත් අලුතින් පොල් පැල ටිකක් හිටවන්න කියලා මම යෝජනා කරනවා. තරංග මන්ත්‍රීතුමා ප්‍රකාශ කල පරිදි 369 උඩුගම -බද්දේගම පැරණිම මාර්ගයක්. නමුත් යන්න එන්න බස් රථයක් නැහැ. උඩුගම ඩිපෝව හරහා බස් රථයක් යොදවන්න කියලා ඉල්ලා සිටිමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සියළුම මන්ත්‍රීවරුන්ගෙන් හා මන්ත්‍රීවරියන්ගෙන් අවසරයි. මම ගිය සභාවාරයේදීත් ඉල්ලීමක් කළා. මාපලගම ළමා උද්‍යානයේ ඔන්චිල්ලාව අළුත්වැඩියා කරන්න කියලා. ඒ වගේම ඉවතලන කුණු කසළ බැහැර කිරීම සඳහා කසළ බඳුනක් ස්ථානගත කරන්න කියලා. නමුත් ඒ දේවල් වුණාද කියන එක සම්බන්ධව මම දන්නෙ නැහැ. ඒ වගේම තල්ගස්වල පොළෙහි පිරිසිදුකම නම් අන්තිමයි. පොළ භූමිය ඇතුල අපිරිසිදු වෙලා. වීථි ලාම්පු පත්තුවෙන්නෙත් නැහැ. ඒ වගේම මම කිහිප

වරක්ම මෙම සභාවෙ කතා කළා. මේ වනතුරු තල්ගස්වල සති පොළෙහි ඇති වැසිකිලියේ යකඩ දොර සම්බන්ධවත් අවශ්‍ය කටයුතු සිදු කරලා නැහැ.

තල්ගස්වල කුඹුරුහේන මාර්ගයට අඩි 4x4 බෝක්කු 02ක් ඉල්ලනවා. එම බෝක්කු ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කර දිමට කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම කුඹුරු සම්බන්ධයෙන් කතා කරන විට අපට කියනවා කුඹුරු කරන්න කියලා. නමුත් පොහොර ලබා දීම සම්බන්ධයෙන් කිසිම ආරංචියක් නැහැ. ඒ සම්බන්ධව ගොවිජන මධ්‍යස්ථානය දැනුවත් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

තල්ගස්වල ඉඩම් බෙදාදීම සම්බන්ධවත් කතා වුණා. ඉඩම් නැති සියළු දෙනාට ඉඩම් ලැබිය යුතුයි. නමුත් ඉඩම් බෙදාදීමේදී නිලධාරීන්ගේ හිතවත්කම් මත ඉඩම් ලබා නොදී සාධාරණ ලෙස ඉඩම් බෙදා දීමේ කටයුතු සිදු කළ යුතුයි.කියල මතක්කරමින් මා නිහඬ වෙනව බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රිනී චන්දිමා දිල්රුක්ෂි මහත්මිය**

ගරු සභාපතිතුමා ප්‍රමුඛ සමස්ථ මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. ඇත්තටම අද මම කතා කරන්නේ ගිය සභා වාරයේදී මම මලාමුර විහාරස්ථානයට කසල බඳුන් 02 ක් සහ වීථි පහනක් ලබා දෙන්න කියලා ඉල්ලුම් කළා. නමුත් මේ වන තෙක් එම ඉල්ලීම් දෙකම ඉටුවෙලා නැහැ. ඒ වගේම අප ප්‍රදේශයේ අහිංසක මිනිස්සුන්ට වැඩිහිටි දීමනාව ලැබිලා නැහැ. ඇත්තටම ඒ මිනිස්සු එම වැඩිහිටි දීමනාව ලබා ගැනීමට යාම සඳහා ත්‍රීවිල් රථයකට රු. 1200.00 ක් පමණ වැය වෙනවා. ඒක විධිමත් ආකාරයෙන්, වසමෙ නිලධාරියො ඉන්නවා. ග්‍රාම නිලධාරී,සමෘද්ධි සංවර්ධන නිලධාරීන්,කෘෂිකර්ම නිලධාරීන්, ඒ වගේ නිලධාරීන් හරහා මෙම දීමනාව ජනතාවට ලබා දෙන්න වැඩිපිළිවෙලක් සකස් කිරීම සඳහා අදාළ ආයතන දැනුවත් කරලා, ඒ අවශ්‍ය කටයුතු සිදු කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම එකම පවුලක කිහිප දෙනෙක් විවිධ දීමනාවන් ලබන අවස්ථා තියෙනවා. මෙම නිලධාරීන් හරහා දීමනාව ලබා ගැනීම තුලින් එම අක්‍රමිකතාවයත් අවම කර ගැනීමේ හැකියාව තියෙනවා. එහෙමනම්, මම වැඩිදුරටත් කතා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. බොහොම ස්තූතියි

**ගරු මන්ත්‍රී සමන් නාපෙ විතානගේ මහතා**

ගරු සභාපතිතුමා ප්‍රමුඛ සමස්ථ මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. පළමුවෙන්ම මම උඩුගම ප්‍රදේශයේ වීථි ලාම්පු ගැන කතා කරනවා නම්, එම වීථි ලාම්පු බහුතරයක් මේ වන විට අක්‍රීය තත්වයේ පවතින්නෙ. එම විථි ලාම්පු යථා තත්වයට පත් කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. මම මීට සභා වාර කිහිපයකදීම සඳහන් කල පරිදි හෝමදොල පාරෙ පොලීසිය ඉදිරිපිට වොටර් බෝඩ් එකෙන් කඩලා තියෙන පාරෙ වලවල් දෙකක් සෑදී ඇති බව සඳහන් කළා. ජීවිත අනතුරක් වෙන්න කලියෙන් මේ සඳහා නිසි වැඩපිළිවෙලක් යොදන්න කියලා ඉල්ලීම් කලත්, තවම එය ඉටු වුනේ නැහැ. ඒ පිළිබඳව නැවතත් මම ඉල්ලා සිටිනවා. ඊට අමතරව උඩුගම හෝමදොළ ජනඋදාන ගම්මානයේ විල්පිට මහතාගේ නිවස අසල තාප්පයක කොටසක් කඩා ගෙන ගිහිල්ලා තියෙනවා. ඒ පිළිබඳව අපේ ජයවීර මන්ත්‍රීතුමා සොයා බලා කටයුතු කරලා තියෙනවා.මම දකින විදියට මේ රජය කටයුතු කරන්නේ අහිංසක දුප්පත් මිනිස්සුන්ට නෙවෙයි. මිළ මුදල් තියෙන මිනිස්සුන්ට. අපේ ඉහළ නායකයින්ට මේ සම්බන්ධව දැනුවත් කලත් වැඩක් නැහැ. ඔබතුමත් ඒ වගේමයි. අපට වැඩක් කරන්නෙ නැහැ. අපි ඔබතුමාට විරුද්ධ නැහැ. සාධාරණ විදියට පක්ෂ පාට භේදයක් නැහැ. කවුරුත් එකයි. නාගොඩ ප්‍රාදේශීය සභාවේ හොද සභාපතිවරයෙක් හිටියා. නමුත් වැඩක් කිරීමේදී උඩුගමට වැඩක් කලේ නැහැ. වීථි ලාම්පු නැහැ. පාරවල් ශුද්ධ කරන්නෙ භාගෙට. සභාපතිතුමනි, සමාවෙන්න වරදක් කියවුනා නම්, ඔබතුමාට ඡන්දය දීපු මිනිස්සුන්ගෙන් සමාව ගන්න.තවදුරටත් කාලය වැයකරන්න යන්නෙ නැහැ.බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, කුරුඳු ඉඩම සම්බන්ධයෙන් මාස 5 ක් 6 ක් තිස්සෙ කතා කළා. නමුත් මන්දගාමී ස්වභාවයක් තියෙන්නෙ. එම කර්තව්‍යය බාරගත් ජයවීර මන්ත්‍රීතුමත් එය නිසියාකාරයෙන් ඉටු කර නැති බව තමයි පෙනෙන්නෙ. නමුත් මේ දේ ප්‍රමාද වුණා වැඩියි. ඍජු ශ්‍රමික පදනම යටතේ වැඩ කරන්න. දැන් පොළ ආදායම සම්බන්ධයෙන් කතා කළා. පැහැදිලි පොළ ආදායම් තත්වයන් වර්ධනය වෙලා තියෙනවා. ඇත්තටම එහි ගෞරවය ආදායම් තත්වය වර්ධනය කර ගැනීම සඳහා සහය දැක්වූ නිලධාරීන්ටත් යනවා. නමුත් වර්තමානයේ ආදායම් තත්වය නිරීක්ෂණය කිරීමේදී, පසුගිය කාලසීමාව තුල පැහැදිලි වංචාවක් වෙලා තියෙනවා කියලා අපට නිරීක්ෂණය වෙනවා. පසුගිය දිනයක සම්බන්ධීකරණ කමිටුව තියලා තියෙනවා. නමුත් අපට ගෞරවණීය ආරාධනාවක් ලැබුනෙ නැහැ. එම කමිටුව පවත්වන්න කටයුතු කරන්නෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා නම්, ඔවුන් අපට ගෞරවණීය ලෙස ආරාධනා කළ යුතුයි. නමුත් වෙලා තියෙන්නෙ එහෙම නෙවෙයිනෙ. අපේ ගෙදර ප්‍රශ්න ගැන කතා කරන්න නෙවෙයි අපි එතනට යන්නෙ.අපේ ගම් ප්‍රදේශයේ ප්‍රශ්න සම්බන්ධයෙන් කතා කරන්න. එම නිසා එම ආරාධනය අපට නිසියාකාරයෙන් ලැබෙන්නෙ නැත්නම් අපි එම කමිටුවට සම්බන්ධ වෙන්න අවශ්‍යතාවයක් නැහැ.

ඒ වගේම දැන් වනමල් මන්ත්‍රීතුමා එක්සත් ජාතික පක්ෂයෙන්ම තරඟ කරලා, එම පක්ෂයෙන්ම මෙම සභාවට මන්ත්‍රීවරයෙක් වශයෙන් ඇවිල්ලා දැන් විපක්ෂ නායකතුමා ගැන කතා කරනවා. ඒ සම්බන්ධයෙන් අපි අපේ කණගාටුව ප්‍රකාශ කරනවා. පසුගිය දිනයකදී මහින්ද මහතා කතාවකදි කියලා තියෙනවා. රනිල් මහත්තයා හොඳ මිනිහෙක් වෙලා අපිත් එක්ක ඉන්නෙ කියලා. ඇත්තටම ඒ සම්බන්ධව අපි කණගාටු වෙනවා. එදා තිබුන තත්වය අනුව රනිල් මහත්තයා පත් වුනේ නැත්නම් පොදුජන එක්සත් පෙරමුණට පාරටවත් බහින්න බැහැ. අපි එම ප්‍රකාශය බලවත් ලෙස පිළිකුලෙන් යුතුව හෙලා දකිනවා.

තල්ගස්වල ඉඩම සම්බන්ධයෙන් කතා කරනවානම්, දැනට අවුරුදු කිහිපයකට පෙර මහා ගංවතුර ව්‍යසන තත්වයකට පත්වූ අවස්ථාවේදී ඉඩම් කච්චේරියක් තිබුනා. වැලිවිටිය ප්‍රදේශයේ තවමත් ඉඩම් නොලැබුනු මිනිස්සු ඉන්නවා. නීතිඥයො දෙනවනම් ඉඩම් බෙදා දීමේ වැඩසටහන තහනම් කරන්න. මොකද, මීට ඉහතදීත් අසාධාරන ලෙස ඉඩම් ලබා දීමේදී මම විරුද්ධ වුනා. හරි නම් මෙහි නියම අයිතිකාරයො විය යුත්තේ 2002 ගංවතුර උවදුරින් බරපතල ලෙස නිවාස හා දේපල හානි වූ පුද්ගලයන්ට. එම වකවානුවෙදිත් ඉඩම් කච්චේරියක් තියලා අදාළ තොරතුරු ලබා ගෙන තියෙනවා. ඒ තොරතුරුත් සාක්ෂි ලෙස මම ලග තියෙනවා. ඕනම අවස්ථාවකදී ඔබතුමන්ලා මේ ඉඩම බෙදාදීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගන්නවනම්, ඒ තොරතුරු ඉදිරිපත් කරන්න මම සූදානම්. මේකෙ නියම අයිතිකරුවො ගම් පුළුල් කිරීම යටතේ ව්‍යාපාරික ප්‍රජාව නෙවෙයි, ගංවතුර ව්‍යසනයෙන් පීඩාවට පත් වුනු මිනිස්සු. මොන පක්ෂවල අයට දුන්නත්, ඇත්තටම නිලධාරීන්ට ඕන විදියටම වැඩ කරන්න දෙන්න එපා.

ඊළඟට අවසාන වශයෙන් දරුවන් ගැන කතා කරනවානම්, උද්ඝෝෂණ අවස්ථාවලදී පවා පලිහ වශයෙන් දරුවන් යොදා ගැනීම සිදු කරනවා. ඒක ඇත්තටම රටට නිගාවක්. දැන් ඇත්තටම පෙළපාලි යන්න අවශ්‍ය නැහැ. වර්තමානය වන විට රට යථා තත්වයට පත් කරමින් ඉන්නෙ. රනිල් වික්‍රමසිංහ මහත්තයා රට භාරගත්තට පස්සෙ ඇත්තටම ආත්ම ශක්තියක් හැදිලා තියෙන්නෙ. එහෙමනම් මම මීට වඩා අදහස් ප්‍රකාශ කරන්න යන්නෙ නැහැ. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුළු සියළුම මන්ත්‍රීවරුන්ගෙන් හා මන්ත්‍රීවරියන්ගෙන් අවසරයි. පසුගිය සංවර්ධන කමිටු රැස්වීමේදී අපට ක්ෂණිකව දැනුම් දීමක් කරලා තිබුණා. එදිනම බද්දේගම ප්‍රාදේශීය සභාවේ කාන්තා මන්ත්‍රීවරියන්ගේ වැඩමුළුවක් තිබුණා. කරන්දෙනිය ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා සහභාගි වෙලා සිටියා. ඔබතුමාටත් එම අවස්ථාවට සහභාගි වෙන්න හැකියාවක් ලැබුනනම් හොඳයි කියලා හිතනවා. සභාවේ සභාපතිතුමාගේ සහ ලේකම්වරයාගේ කාර්ය භාර්ය මනාව අවබෝධ කරලා දුන්නා. එමෙන්ම මන්ත්‍රීවරුන් කරන වැරදි පහදලා දුන්නා.දැන්වත් ඔබතුමාල තමතමන්ගෙ ගරුත්වය ආරක්ෂා කරගෙන මේ මාස ටිකේවත් තිබෙන ව්‍යවස්ථාව අනුව සභාවේ කටයුතු කරන්න කියල ඉල්ලනවා. ඒවගේම සභාවෙ කටයුතුවලදී ඇහුම්කන් දීම කරන්න, පස්සෙ සභාපතිතුමාට දොස් පවරන්නෙ නැතුව.

ඒවගේම මේ සභාවෙ ගොවිතැන් පොහොර ගැන කතා කළා. නමුත් ඌරල ගොවිජන සේවා මධ්‍යස්ථානය මගින් කන්න රැස්වීම් තියලා ඒ කටයුතු හරියාකාරයෙන් සිදු කරනවා. මම එය මේ අවස්ථාවෙ අගය කරනු ලබනවා. සමෘද්ධි ගෙවල් පිළිබඳ අධ්‍යනයක් සිදු කර විෂමතා අවම කර, එක් ගෙදරකට එක් ප්‍රතිලාභයක් ලැබෙන පරිදි දීමනා බෙදීම් සිදු කරනු ලබනවා. ඇත්තටම විය යුත්තේ එක් ගෙදරකට එක් දීමනාවක් ලැබීම පමණයි. යටලමත්ත සමෘද්ධි නිලධාරීන් කරන ඒ කර්තව්‍යය අපි අගය කල යුතුයි. Lolc ආයතනය මගින් පසුගිය දවසක සහල් සහනාධාරයක් දුන්නා. ඒ දේත් අපේ සමෘද්ධි නිලධාරීන් මගින් නිසියාකාරව ඉටු කරනු ලැබුවා. වැඩිමනක් කතා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ.බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා**

මූලාසනාරූඪ ගරු සභාපතිතුමාගෙන් අවසරයි. අපි අවුරුදු 05 ක් තිස්සෙ හැම සභා වාරයකදීම ප්‍රකාශ කරන උඩුගම ශ්‍රවනාගාරය සම්බන්ධව. මේ වන විට සමහර අඩුපාඩු සකස් කරලා තියෙනවා. උප කාර්යාලයෙ ඉදිරිපස සිවිලිම ගැලවිලා හදිසියෙවත් මෙම ගොඩනැගිල්ල ඉදිරිපිට සිටින විට අවාසනාවකට හෝ මනුස්සයෙකුගෙ හිසට යකඩ කැබැල්ලක් වැටිලා, ඔළුව පැලුනොත් මේවට සභාපතිතුමා ඇතුළු නිලධාරීන් වග කිව යුතුයි. නමුත් මේ සම්බන්ධයෙන් නිලධාරීන්ට කොතෙක් දැනුවත් කලත්, එය තවම ක්‍රියාත්මක වෙලා නැහැ. 2018 සිට පසුගිය වර්ෂය දක්වා, අයවැය ලේඛන මේ සභාවට ඉදිරිපත් කළා. ඇත්තටම ලැජ්ජයි. සභාවෙ ආදායම් උත්පාදනයක් මේ වන තෙක් සිද්ධ වෙලා නැහැ. ජ්‍යෙෂ්ඨ සභාපතිවරු, උප සභාපතිවරු ඉන්නවා. හැමෝටම දොස් කිය කිය කරන්නෙ බොරුවක්. අපි මන්ත්‍රී මණ්ඩලය වෙනුවෙන් මාසිකව ලක්ෂ 5 ක් පමණ වැය කරනවා.නමුත් ගම්වාසීන්ට ලැබුනු දෙයක් නැහැ. මේ සභාව විසුරුවන්න කියලා මම දැනුත් කියනවා. සභාවන්වල මන්ත්‍රීවරු පාලනය කරන්න, කෝටි 12ක් පමණ යනවා. මේ අපි අවුරුදු 4 ½ ක් තිස්සෙ අපේ ජීවිතය දිහා බලනවා වගේම ප්‍රාදේශීය සභා ගමන් මාර්ගය දිහා බැලුවම කණගාටුවක් දැනෙනවා. ඔබතුමා ඇස්තමේන්තු කළා. ඊට එහාට යන්න ඔබතුමා සැළැස්මක් හදන්න බැරිවුනා. ඊළඟ සභාව වන විට මේ සභා වාරයේ කරලා තියෙන දේවල් සම්බන්ධව වාර්තාවක් ඉදිරිපත් කරන්න. එවිට සතුටු වෙන්න පුලුවන්. ගිය සභා වාරවල මහ පුදුමාකාර තීන්දු තීරණ අරගෙන ක්‍රියාත්මක කරලා තියෙනවා කියලා, ඒවායින් ලැබෙන ප්‍රතිලාභ මේ සභාව තුලදී අපට බලාගන්න ලැබෙන්නෙ නැහැ. ඇත්තටම මේ සභාවෙ සංයුතිය අඩුවෙන්න ඕන. ඔබතුමා නඩත්තු කරන්නත් ලක්ෂ 5 ක් යනවා. තමා ලබන වරප්‍රසාද වෙනුවෙන් මන්ත්‍රීවරුන් වෙනුවෙන්, නිලධාරීන් වෙනුවෙන් ඔබතුමට මනා වගකීමක් තියෙනවා. ඒ වගේම රටේ ප්‍රශ්ණයක් තියෙනවා. බැංකු පොලී අනුපාතය වැඩිවෙලා, බදු පිට බදු ගහලා, රට ප්‍රපාතයකට යනවා. ආයතනවලටත් ව්‍යාපාරික ක්ෂේත්‍රවලටත් දැඩි බලපෑමක් එල්ල වෙලා තියෙන්නෙ. ඒවගේම රට බංකොලොත් වෙලා තියෙන්නෙ. මැයි 9 වනදා සිද්ධිය වූ දවසෙත් අපිව බලන්න එක නායකයෙක් හිටියෙ නැහැ. අපි ඔවුන් වෙනුවෙන් කටයුතු කලාට හැමෝම තම තමන් ගැන විතරයි හිතන්නෙ.

නිකරුනේ මුදල් නාස්ති කරලා, ලස්සන පොත් ගහලා අයවැය වාර්තාවක් ගේන්න එපා. 2023 ආදායම් උත්පාදන වර්ෂයක් ගේන්න කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා**

ගරු සභාපතිතුමා ප්‍රමුඛ සමස්ථ මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. මාපලගම තල්ගස්වල ඉඩම සම්බන්ධයෙන් කතා කරන විට එවකට හිටපු නිලධාරීන් ගම් පුළුල් කිරීම යටතේ ඉඩම් පවරලා තිබුනෙ නැහැ. එම ඉඩම් බෙදාදුන්නෙ නැහැ. පියසේන ගමගේ මහත්තය එක්සත් ජාතික පක්ෂයේ අය වැඩියි කියලා, දෙසියගානක් ඉන්නවා කියලා පක්ෂපාතීව කතාකරලා වැඩ නවත්වලා ඒවත් බෙදා දුන්නෙ සිංහල මිනිස්සුන්ට. දෙමල ජනතාව ඔවුන්ට නිවාස නොමැතිව එක නිවසක පවුල් 2 ක් වශයෙනුත් ජීවත් වෙනවා. ධීවර ගම්මානයේ ඉන්න අයටත් ඉඩම් ලැබිලා තියෙන්නෙ ඒ විදියට. ඇත්තටම වැරදියි. නිලධාරීන්ගේ නිවෙස්වල වැඩ කරන්න එන අයගෙ පවුල්වල අයට තමයි ආධාර ද්‍රව්‍ය ලබා දෙන්නෙත්. වෙරංග මන්ත්‍රීතුමා කතා කරන විට අපි කිව්වා මෙයාලට කඩේ යන්න එපා කියලා. නායකයන්ට වන්දනාමාන කරන්න යන්න එපා කියලා. නමුත් ඇහුවෙ නැහැ. වනමල් මන්ත්‍රීතුමා, ඔබතුමා කතා කරන විට එය තේරුම් අරගෙන කතා කරන්න. මොකද ඔබතුමා පක්ෂයෙන් ඉවත්වෙලා නෙවෙයි වෙනත් පක්ෂයක් සම්බන්ධයෙන් කතා කරන්නෙ. එය එතරම් ගැලපෙන්නෙ නැති ක්‍රියාවක්
එමෙන්ම, දැන් කාබිල් වත්ත පාරෙ යන්න බැහැ. හොදට තිබිච්ච පාරෙ දැන් යන්න බැරි තත්වයට පත්වෙලා තියෙන්නෙ. ගෙදරකට ගිහිල්ල ඡන්දයක් ගන්න බැරි තත්වයක් තියෙන්නෙ. අදටත් ඉඩමක අයිතියක් කියන්න බැරි මිනිස්සු ඉන්නවා. අපට පුළුවන් ප්‍රමාණයෙන් හරි වචනයකින් හරි, උදව්වක් කරන්න පුළුවන් නම් ඒ මිනිස්සුන්ට ඒක වටිනවා. ඒ වගේම තල්ගස්වල පොලේ වෙළෙන්දොත් අඩුයි. මිනිස්සුත් අඩුයි. මේ හේතුන් නිසා පොළ ටෙන්ඩර් කිරීමේදී ටෙන්ඩර් මුදල වැඩි නොකර,අඩු කරන්න කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

**ගරු උප සභාපති එම්.කේ. ගාමිණී සුසන්ත මහතා**

ගරු සභාපතිතුමාගෙන් ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. අද සභාව වේලාසනින් නිම කරන්න තිබුනත්, වෙනද වගේම වෙනත් කරුණු යටතේ කතාකළ යුතු කරුණු විශාල ප්‍රමාණයක් සාකච්ඡා වුණා. මම මෙය අවස්ථාවක් කරගන්නවා. මටත් අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව සම්බන්ධයෙන් කතාවුනා. ඇත්තටම ආසන සංවිධායකවරයා ඇවිල්ල ගන්න තීන්දු තීරණ සම්බන්ධයෙන් මට මහ ලොකු දැනුවත් භාවයක් නැහැ. මම ගියෙත් මගේ පුද්ගලික ප්‍රශ්නයකට මාමන දොළ ඇළ සංවර්ධන කාර්යයක් කළා. ඒ විදිහට කෙරෙන්න ඕන කාර්යය කෙරුනෙ නැහැ. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව මගින් රැස්වීම පැවැත්වීම සඳහා දැනුවත් කිරීම සම්බන්ධයෙන් මන්ත්‍රීවරුන්ට අසාධාරණයක් වෙලා තියෙනවානම්, මම මේ අවස්ථාවෙ ඒ සම්බන්ධව කණගාටුව ප්‍රකාශ කරනවා. ඒවගේම රටේ දේශපාලන ආර්ථික තත්වය සම්බන්ධයෙන් කතා කරනවානම්, ආණ්ඩු පක්ෂ නියෝජනය කරන මන්ත්‍රීවරු කිහිප දෙනෙක් ඉන්නවා. මන්ත්‍රීවරුන්ගෙ පක්ෂ ක්‍රියාකාරිත්වය පිළිබඳ ප්‍රශ්ණ තියෙනවා. ඊළග මැතිවරණ ක්‍රමයේදී බොහෝ දුරට මන්ත්‍රීවරු සංඛ්‍යාව 13, 14 කට සීමා වනවද කියන එක සම්බන්ධව තවම නිවැරදිව ප්‍රකාශ කරන්න බැහැ. ලබන වසරේ මාර්තු මාසය වන විට සභා වාරය අවසන් කර කොමසාරිස් පාලනයකට යාවි කියලා බොහෝ දුරට සිතනවා. අයවැය යෝජනා සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කලත්, අයවැය යෝජනා 100% ක්ම ක්‍රියාත්මක වූ සභා වාරයක් අප සභා ඉතිහාසයේ නැහැ. මන්ත්‍රීවරුන්ගේ යෝජනා ක්‍රියාත්මක කරන්න ගත්ත අවස්ථා තියෙනවා. දැන් මන්ත්‍රීවරුන්ගෙ යෝජනා ක්‍රියාත්මක කිරීමේදි සභාපතිතුමාට ඉතා අසීරු අවස්ථාවකට තමයි මුහුන පාන්න සිදු වෙලා තියෙන්නෙ. මොකද කියනවනම්, පළාත් නිශ්චිත හරහා කරන ව්‍යාපෘති නම් කරලමයි දැන් යම් කිසි ව්‍යාපෘතියක් එන්නෙ. මෙහි මෙහෙයවීමේ කටයුත්ත අදෘශ්‍යමාන හස්තයක් මගින් තමයි ක්‍රියාත්මක වෙන්නෙ. මේ හේතුව නිසා සභාවේ සභාපතිට හරි ප්‍රශ්නයක් වෙලා තියෙනවා. මෙතුමගේ නායකත්වයේ ලොකුම දුර්වලතාවය තමයි යම් යෝජනාවක් ගත්තට පස්සෙ එය ස්ථිර නොකර තමයි ඊළග යෝජනාවට යන්නෙ. සභාවේ ආදායම් උත්පාදන යෝජනාව අනුව ක්‍රියාත්මක වුනේ නැහැ කියලා වෙරංග මන්ත්‍රීතුමා, ඔබතුමා කතා කලත්, ඔබට ඒ තත්වයෙන් අත්මිදෙන්න බැහැ.

රනිල් වික්‍රමසිංහ මහතාගේ දූරදර්ශී දේශපාලනය නිසා වෙන්න ඇති හොරු හොරු කිව්වට ඔප්පු කරගන්න බැරිවුණා. දේශපාලන කතා මම කියන්න යන්නෙ නැහැ. ඊළඟ අයවැයට පක්ෂව නොදුන්නත්, විපක්ෂව දුන්නත් මොකද කියලා හිතනවා. මම මීට වැඩිය කතා කරන්න අදහස් කරන්නෙ නැහැ. මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී එන්.ඩබ්.පතිනායක මහතා**

ගරු සභාපතිතුමා ප්‍රමුඛ සමස්ථ මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. ඇත්තටම ඌරල කොතේගොඩකන්ද තැපැල් කන්තොරුව අසළ ප්‍රදේශයේ ඇළ අසළ තියෙන ක්‍රීඩාංගනයේ මැණුම් කටයුතු කරලා දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලීම් කරනවා. ඒවගේම ඔබතුමා මැදිහත්වෙලා හරි එය ඉටු කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. දැන් කයින පිංකම් කාලය නිසා වීපී පහන් ටික අළුත්වැඩියා කරලා දෙන්න කියලා ඉල්ලනවා.

එමෙන්ම මේ අවස්ථාවේදී කතා වුනා. සමෘද්ධි සහනාධාරය සම්බන්ධව. රාජ්‍ය සේවකයන් ඉන්න ගෙවල්වල ගෘහමූලික දෙක හදලා තියෙන්නෙ. නමුත් එක නිවෙසෙ ඉන්නෙ. එකම ගෙදරට විවිධ සහනාධාර තුනක් පවා තියෙන ගෙවල් තියෙනවා. මේ දිහා බැලුවම, ලොකු අක්‍රමිකතා තියෙනවා. මේ සභාවෙදි අපි කතා කරන දෙයක් ක්‍රියාත්මක වෙන්නෙ නැත්නම් ලොකු කණගාටුවක් තියෙනවා. ඌරල පූට්ටු පාලමේ ඇදි දෙක මෙතනට ගෙනැල්ලා තියෙනවා. එය කඩිනමින් සොයා බලා සවි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන මෙන් ඉල්ලා සිටිමින්, මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. ගරු මන්ත්‍රීවරුනි, අද සභාවේ ප්‍රකාශිත චෝදනා, යෝජනා සම්බන්ධයෙන් පිළිතුරු කතාව කරන විට සියලු දෙනාම සාවධානව ඇහුම්කන් දීම කරනවා නම්, මම හිතනවා එම චෝදනා පිළිබඳ අදහස් වෙනස් වේවි කියලා. මම පළමුව ප්‍රකාශ කිරීමට කැමතියි. මෙහි පැනනැගුනු ඉඩම් ප්‍රශ්නය පිළිබඳ පිළිතුරක් ලබා දෙන්න. ඔබලාට මතක ඇති 2003 සහ 2017 වර්ෂවල ඇති වූ විශාල ගංවතුර සහ නායයෑම්. මෙහිදී අවතැන් වූ හිනිදුම ආසනයේ තෝරාගත් පවුල් සඳහා රජයෙන් ඉඩම් ලබා දීමට සැලසුම් කොට, උඩුගම අලුත්වත්ත සහ තල්ගස්වල වත්තෙන් යම් ඉඩම් ප්‍රමාණයක් රජයට පවරා ගෙන, අදාල අවතැන්වූවන්ට ලබාදීමට කටයුතු කරලා තිබුණා. මෙම ඉඩම් ලබා දීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා තෝරා ගත් පවුල් සඳහා පමණක් ලබා දුන් අතර, දේශපාලන අධිකාරිය තෝරාදුන් පවුල් නොවන බව පළමුව කිව යුතුයි. නමුත් සමහර ඉඩම් ලාභීන් තමාට ලබා දුන් ඉඩම් ප්‍රතික්ෂේප කළ නිසා, මේ වනතුරුත් ඔවුන්ට ඉඩම් ලබාදීමට හැකියාව ලැබී නැහැ. ඒ අනුව පසුගිය සම්බන්ධීකරණ කමිටුවේ ගරු සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී සම්පත් අතුකෝරල මහතා විසින් ඒ පිළිබඳව ප්‍රශ්න කිරීමේදී ප්‍රාදේශීය ලේකම්තුමාගෙන් ප්‍රකාශ වූයේ, ඉදිරියේ දී මෙම තල්ගස්වල ඉඩම මැනුම් කටයුතු සිදු කර, මේ වනවිට තෝරාගෙන ඇති ඉඩම් නොමැති සහ ගංවතුරෙන් අවතැන්වූ අයට මෙම ඉඩමෙන් ඉඩම් කොටස් ලබාදීමට කටයුතු කරන බවයි. මෙම ඉඩම් ලබා දීමේදී කිසිඳු ආකාරයකින් දේශපාලන ඇඟිලි ගැසීමක් සිදු නොවන බව ද ප්‍රකාශ කරන්න කැමතියි. මෙම ඉඩම් ලබාදීම ලබාදී ඇති නිර්ණායකයන්ට අනුව සිදුවන බවත් ප්‍රකාශ කළ යුතුයි.

ඒ වගේම වර්තමානයේ විශාල ගැටලුවක්ව පැවති, පෙර ලබාදී ඇති ඉඩම් වල නීත්‍යානුකූල අයිතිය, ඉඩම් ඔප්පු ලබාදීම මේ වන විට ක්‍රියාත්මක වන බවත්, පසුගියදා අප බල ප්‍රදේශය ඔප්පු ලබා දීම ගරු ආණ්ඩුකාරවර විලී ගමගේ මැතිතුමා සහ පාර්ලිමේන්තු මන්ත්‍රී සම්පත් අතුකෝරල මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්, නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී සිදුකළ බවත් ප්‍රකාශ කරන්න කැමතියි. මෙයට වර්තමාන පළාත් ඉඩම් කොමසාරිස් නාගොඩ හිටපු ප්‍රාදේශීය මහ ලේකම් යූ. චන්ද්‍රලාල්

මැතිතුමා ඉතාම ඕනෑකමකින් කටයුතු කරන බවත් සිහිපත් කරනවා. එතුමා බොහොම දක්ෂ නිලධාරියෙක් සේම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ධූරය දරන අවධියේ අපට බොහොම උදව් කළා ආදාහනාගාරය ඉදිවන ඉඩම සහ තල්ගස්වල වෙළඳ සංකීර්ණය ඉදිවන ඉඩම ලබා දීමට. එතුමා මා හට විශේෂත්වයක් දක්වන බවත්, ඒ ඇයිද කියා ඇසුවම, මම කවදාවත් පෞද්ගලික දෙයකට නොව පොදු අවශ්‍යතාවය මත පදනම්ව කටයුතු කරන දේශපාලනඥයෙක් හැටියට සැලකීම කරන බවත් ප්‍රකාශ කළා.

ඒ වගේම දැනට කොම්පෝස්ට් අංගනය පිහිටි ඉඩම, එහි අපට මැණ වෙන් කර දී ඇති භූමි ප්‍රමාණය වන අක්කර 5 ක ඉඩම නීත්‍යානුකූලව ලබා දීමට මේ වන විට කටයුතු සිදු කරමින් ඉන්නේ. නමුත් අප ප්‍රකාශ කරන ඉල්ලීම් වනුයේ, අප සභාවට නිශාන්ත මුතුහෙට්ටිගම හිටපු සභාපතිතුමාගෙ කාලයේ ලබාදී තිබූ අක්කර 35 භූමියම නැවත සභාවට පවරා දෙන ලෙස. මොකද එය අප සභාවට විශාල සම්පතක් දුප්පත් සභාවක් හැටියට. දැනටමත් මෙහි අක්කර අටක විතර භූමිය සභාව විසින් භුක්ති විඳිනවා. පහුගිය කාලයේ එය එළිපෙහෙළි කළේ, ඒ භූමි ප්‍රමාණයවත් ආරක්ෂා කරගන්නයි. මේ වන විට මිනිසුන් බලහත්කාරයෙන් ඉඩම් අල්ලාගෙන තියෙනවා.

ඒ වගේම උනන්විටිය ප්‍රදේශයේ ඇති පොදු සුසාන භූමියකට වෙන් වී ඇති අක්කර එකහමාරක විතර භූමිය මේ වන විට එම්. එම්. දිසානායක මන්ත්‍රීතුමාගේ මැදිහත්වීම මත මැණ වෙන් කර ඇති බවත්, යථා කාලයේදී එය සභාව මගින් පාලනය කිරීමට කටයුතු කරන බවත්, තවත් එම ප්‍රදේශයේ පර්චස් 120ක භූමි ප්‍රමාණයක් පොදු කටයුතු සඳහා වෙන් කර ඇති බවත්, එයද යථා කාලයේදී සභාවට ලබා ගැනීමට කටයුතු කරන බවත් ප්‍රකාශ කරන්න කැමතියි.

ඒ වගේම සමන් මන්ත්‍රීතුමාගේ හා වෙරංග මන්ත්‍රීතුමාගේ චෝදනා වලට මම පිළිතුරු ලබාදීමට නොයමි. මන්ද එතුමන්ලාගේ හැමදාම චෝදනාව එකම නිසා. නමුත් වෙරංග මන්ත්‍රීතුමාගේ යම් යම් චෝදනා වලට උප සභාපති තුමාගේ කතාවේදී උත්තර ලැබුණා කියා මා සිතනවා. ඒ සියල්ලටම මූල සභාවේ මූල්‍ය තත්ත්වයයි. උප සභාපතිතුමා ප්‍රකාශ කළේ වෙන දා පළාත් නිශ්චිත කියා මුදල් කෙලින්ම සභාව වෙත එනවා. දැන් ඒ මුදල් එවන විට කලයුතු කාර්යයක් නම් කර එවනවා. මේ වෙනකොට එහෙම වත් නැහැ. ඒ වගේම මූල්‍ය තත්ත්වය දුර්වල වුවත්, අපට ලැබෙන මුදලින් තමයි ඔබතුමන්ලා ගෙ යම් යම් දීමනාවන් ගෙවන්න වෙන්නේ. මම පෙර පාසල් සහය පාලිකාවන්ට යම් ගෙවීමක් කරන්න යෝජනා කළේ වර්තමානයේ ඇති වී ඇති ආර්ථික අර්බුදය එතුමියන්ලාටත් පොදු නිසා. ඒ වගේම පෙර පාසල් දරුවන්ට පෝෂ්‍යදායි ආහාර වේලක් දීමට උපදෙස් ලැබී තියෙනවා. ඒ සඳහා පළාත් සභාවෙන් මුදල් ප්‍රතිපාදන ලැබෙන තෙක් සභා අරමුදලෙන් එම වැය දැරීමට සිදුවෙනවා.

ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතාගේ කතාවේදී මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා ප්‍රකාශ කළ ප්‍රකාශයක් පිළිබඳව මතක් කළා. මන්ත්‍රීතුමනි එතුමා එම ප්‍රකාශය කළේ දේශපාලන උපක්‍රමයක් සේ සළකලා. පාක්ෂිකයින් කුල්මත් කිරීමට මිස අහිතකින් නොවේ. කොහොම වුණත් මොන දේශපාලනය කලත් මට හිතෙනවා අපි සියලුම දෙනා එකට එකතු වී වැඩ කළොත්, රට නැවත ලෝකයේ උතුම් රට බවට පත් කිරීමට ශක්තියක් ඇති බව. එසේ කිරීමට අප සියලු දෙනා වාද භේද අතහැර එකා වගේ වැඩ කිරීමට ශක්තිය ධෛර්යය ලැබේවායි පතමින්, සියලු දෙනාට තෙරුවන් සරණ පතමින් අද සභාව මෙතනින් නිම කරනවා.

සභාපති

නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී දිනය:-